# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. **සම්බන්ධ වන ආයතන**

1.1. දෙපාර්තමේන්තුව : රජයේ ප්‍රවෘත්ති
යොමු අංකය : රප්‍ර/ආ02/01/04/001 දිනය : 2023.08.15

1.2. අමාත්‍යාංශය : ජනමාධ්‍ය
යොමු අංකය : MMI/AD2/12/1/145-Vol I දිනය : 2023.08.22

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1134/V- II දිනය : 2021.08.31

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-2/04/REC/3051 දිනය : 2023.06.07

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NPC/06/31/91/SR දිනය : 2023.03.14

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/04-01-28/03/2023 දිනය : 2024.02.02

02. **පත් කිරීමේ බලධරයා** : **රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

03. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1. සේවා ගණය : ජ්‍යෙෂ්ඨ විධායක

3.2. ශ්‍රේණිය : විශේෂ

3.3. පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය / අණදීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූද, ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ කොටසක් වශයෙන් ගිනිය හැක්කා වූ කාර්යයන් ඉටු කරන නිලධර ගණයකි.

04. **තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය** : මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය
සටහන : විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය



nd

## 05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : SL 3 - 2016

5.2. මාසික වැටුප් පරිමාණය : රු.88,000 – 12 * 2,700 - 120,400/-

## 06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | විශේෂ | 01 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අරමුණ හා මෙහෙවරට සමගාමී කාර්යභාරය ඉටු කිරීමෙහිලා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකාරීත්වයට අදාළ ප්‍රවෘත්ති ප්‍රචාරණය, මාධ්‍ය හා සන්නිවේදන කටයුතු පිළිබඳ වගකීම් හා ඊට අදාළ කාර්යයන් ඉටු කිරීමට නායකත්වය දීම |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - 01

## 07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ

7.3.2 සුදුසුකම්

| | | | |
|---|---|---|---|
| 7.3.2.1 | අධ්‍යාපන සුදුසුකම් | : | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජනමාධ්‍ය, ජනසන්නිවේදනය හෝ මාධ්‍යකරණය යන විෂයයන්ට අදාළ විෂය ක්ෂේත්‍රයක පශ්චාත් උපාධිය සම්පූර්ණ කර තිබීම් |
| 7.3.2.2 | වෘත්තිය සුදුසුකම් | : | අදාළ නොවේ |
| 7.3.2.3 | පළපුරුද්ද | : | I. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත විධායක සේවා ශ්‍රේණියේ (SL – 1) තනතුරක වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ නිලධරයෙකු වීම<br>II. ඉහත උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන සේවා ශ්‍රේණියේ තනතුරුවලට අදාළ විධායක ශ්‍රේණියේ වසර 18කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කිරීම |
| 7.3.2.4 | කායික සුදුසුකම් | : | සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය |
| 7.3.2.5 | වෙනත් | : | I. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.<br>II. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ තුළ වාර්ෂික කාර්යසාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. |

IV. අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා තිබිය යුතුය

V. තනතුරට බඳවා ගැනීම් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාළ නොවේ

**7.3.4** බඳවා ගැනීම් ක්‍රමය

| | | | |
|---|---|---|---|
| 7.3.4.1 | ලිඛිත විභාගය | : | අදාළ නොවේ |
| 7.3.4.2 | වෘත්තීය පරීක්ෂණය | : | අදාළ නොවේ |
| 7.3.4.3 | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය | : | අදාළ නොවේ |
| 7.3.4.4 | යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : | | |

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අමතර අධ්‍යාපන සුදුසුකම් | 25 | උපරිම ලකුණු ලබා ගත් අය තෝරා පත් කර ගනු ලැබේ<br><br>(ඇමුණුම I) |
| පළපුරුද්ද (අවුරුදු 06ට වැඩි) | 20 | |
| භාෂා ප්‍රාගුණ්‍යය | 20 | |
| පරිගණක දැනුම | 15 | |
| තනතුරට අදාල ක්ෂේත්‍රය තුල සිදු කල විශේෂ ව්‍යාපෘති | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

සටහන :

I. ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත්, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කොරනු ඇත

II. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ

7.3.4.4.1 : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

08. **කාර්යක්ෂමතා කඩඉම්** : අදාළ නොවේ

09. **භාෂා ප්‍රවීණතාව** : අදාළ නොවේ

10. **ශ්‍රේණි උසස් කිරීම** : අදාළ නොවේ

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : අදාළ නොවේ

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ

සකස් කළේ :-

අත්සන : ..............................

නම : උදානි වරුසවිතාන

තනතුර : අධ්‍යක්ෂ (පාලන) - වැ.බ.

දිනය : 2024.07..25....

උදානි වරුසවිතාන
අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ - 05

පරීක්ෂා කළේ :-

අත්සන : ..............................

නම : ඕමාලි විමලරත්න

තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2024.07.25....

ඕමාලි විමලරත්න
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ - 05.

අත්සන : ..............................

නම : දිනිත් චින්තක කරුණාරත්න

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2024.07. 25...

නිල මුද්‍රාව :

දිනිත් චින්තක කරුණාරත්න
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**18.** අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :

2024.02.02........ දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය

දිනය : 2024.08...09.......

නිල මුද්‍රාව : ඩී.පී.ජේ. අනුෂ පැල්පිට
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය
163, "ඇසිදිසි මැදුර", කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ, කොළඹ-05.

**19.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/04-01-29/03/2023

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.02.02.............. දින අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : [illegible] දයාරත්න

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2024.09.13..........

නිල මුද්‍රාව : [illegible] දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය

01. පරීක්ෂණයේ නම : ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. අමතර අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 25 | • බඳවා ගැනීමේදී සලකා බලනු ලබන ජනමාධ්‍ය, ජනසන්නිවේදනය හෝ මාධ්‍යකරණය යන විෂයයන්ට අදාළ විෂය ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් වෙනත් විෂය ක්ෂේත්‍රයක පශ්චාත් උපාධිය<br>ලකුණු 25<br>• විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් වෙනත් විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම<br>ලකුණු 15<br>• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් වෙනත් විෂය ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම<br>ලකුණු 10 |
| II. පළපුරුද්ද | ලකුණු 20 | • මූලික සුදුසුකම්වලට අදාළ වසර 06ක සේවා කාලයෙන් පසුව එළඹෙන අමතර සේවා |



no

| | | |
|---|---|---|
| | | කාලය සඳහා පමණක් පහත සඳහන් පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.<br>පූර්වාසන්න වසර 05ක කාර්යසාධනය සඳහා,<br>(a). විශිෂ්ඨ - ලකුණු 04<br>(b). සාමාන්‍ය ප්‍රමාණයට ඉහළ - ලකුණු 03<br>(c). සතුටුදායක - ලකුණු 02<br>උපරිමය ලකුණු 20 |
| III. භාෂා ප්‍රාගුණ්‍යය | ලකුණු 20 | • විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම/ මූලික හෝ පශ්චාත් උපාධියක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සම්පූර්ණ කර තිබීම<br>ලකුණු 10<br>• සිංහල මාධ්‍ය අයැදුම්කරුවෙකු දෙමළ භාෂාව ද, දෙමළ මාධ්‍ය අයැදුම්කරුවෙකු සිංහල භාෂාව ද, ඉංග්‍රීසි මාධ්‍ය අයැදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ භාෂාවලින් එක් භාෂාවක් ද අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් ප්‍රධාන විෂයයක් ලෙස සමත් වීම හෝ ඊට ඉහළ සුදුසුකමක් (දෙවන භාෂාව ලෙස හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ)<br>ලකුණු 05<br>• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් වෙනත් භාෂාවක් පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම<br>ලකුණු 05 |
| IV. පරිගණක දැනුම | ලකුණු 15 | • විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත |

| | | |
|---|---|---|
| | | අධ්‍යාපන ආයතනයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ආශ්‍රිත විෂයයක ලබා ගත් පරිගණක උපාධිය හෝ පශ්චාත් උපාධිය<br>**ලකුණු 15**<br>• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් වසරකට නොඅඩු කාලයක පරිගණක ඩිප්ලෝමාවක් ලබා තිබීම<br>**ලකුණු 10**<br>• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අධ්‍යාපන ආයතනයකින් මාස හයක් හෝ ඊට නොඅඩු කාලයක පරිගණක ඩිප්ලෝමාවක් හදාරා තිබීම<br>**ලකුණු 05**<br>**(සැ.යු. : මෙහිදී අයදුම්කරු සතු උපරිම සුදුසුකම සලකා බලනු ලැබේ)** |
| V. අදාල ක්ෂේත්‍රය තුල සිදුකල විශේෂ ව්‍යාපෘති | ලකුණු 15 | • දෙපාර්තමේන්තුවේ දෛනික කාර්යයන්ගෙන් බැහැරව, නව මානයකින් තමා විසින් හඳුන්වා දුන් මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වැඩ සටහනක් ඉදිරිපත් කිරීම හෝ විෂයයන්ගෙන් පරිබාහිර විෂයයක් අරබයා සිදු කල විශේෂ ව්‍යාපෘති 05ක් (මුද්‍රිත)<br>**එකකට ලකුණු 03 බැගින් ලකුණු 15**<br>• දෛනික කාර්යයන්ගෙන් බැහැර නව වැඩසටහන් 2ක් හඳුන්වා දී රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කිරීම<br>**එකකට ලකුණු 05 බැගින් ලකුණු 10** |

| | | |
|---|---|---|
| VI. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | ලකුණු 05 | ▪ නායකත්වය, ආකල්ප,පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා<br>ලකුණු 05 |

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් මගින්

04. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : අවශ්‍යතාව පරිදි

**සකස් කළේ :-**

අත්සන : ....................................
නම : උදානි වරුසවිතාන
තනතුර : අධ්‍යක්ෂ (පාලන) - වැ.බ.
දිනය : 2024.07.. ..25...

උදානි වරුසවිතාන
අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ - 05

**පරීක්ෂා කළේ :-**

අත්සන : ....................................
නම : ඔමාලි විමලරත්න
තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2024.07. 25...

ඔමාලි විමලරත්න
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ - 05.

අත්සන : ....................................
නම : දිනිත් චින්තක කරුණාරත්න
තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2024.07. 26........
නිල මුද්‍රාව :

දිනිත් චින්තක කරුණාරත්න
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.